# සොබාසිරියෙන් පිරි බෙල්ලන්විල වගුරුබිම

මහාචාර්ය ලක්ෂ්මන් වෛද්‍යසේකර

## ජෛව විවිධත්වය


බෙල්ලන්විල ගැන දන්නා අය ලංකාවේ සැම පෙදෙසක ම වාගේ ජීවත් වේ. මෙම ප්‍රදේශයේ ඇති වැඳුම් පිදුම් කරන ප්‍රසිද්ධ පූජ්‍ය භූමියකි, බෙල්ලන්විල පන්සල. බෙල්ලන්විල පන්සල ගැන අපට අසන්නට ලැබෙන පුරාතන කථා රැසකි. වසරක් පාසා එහි පැවැත්වෙන ඇසල උත්සව පෙරහැර ගැනත් කව්රුත් දනිති. තවද මෙම පෙදෙසෙහි පරිසරයට හිතකර සොබාසිරියෙන් පිරි ජෛව විවිධත්වය පෙන්වන වටිනා තෙත්බිමකි. නැතහොත් වගුරු බිමකි. මෙය ස්වාභාවිකව අප ලබා ඇති ඉතා මහඟු දායාදයකි. බෙල්ලන්විල – අත්තිඩිය වගුරුබිම වශයෙන් නම් කර ඇති කොළඹට නුදුරු දකුණු කොළඹ පිහිටි එකම තෙත් බිම මෙයයි.

බෙල්ලන්විල තෙත් බිම ගැන ප්‍රසිද්ධියට පත්වූ කරුණු රාශියකි. එනිසා මෙය බෙල්ලන්විල – අත්තිඩිය අභය භූමිය ලෙස ද වෙන්කර ඇත. බෙල්ලන්විල අත්තිඩිය වගුරු භූමියේ පිහිටීම ගැන නම් කළ හැකි ජලාශය බොල්ගොඩ ගඟ ය. මෙම වගුරු බිමට යොදා තිබි තවත් නමක් වන්නේ අඳවෙල වගුරුබිමයි. වගුරු බිමෙහි ප්‍රමාණය හෙක්ටයාර් 372 ක් යයි සැලකේ. තෙත්බිම සිතියම අනුව එක් අතකින් බොරුපන සම්බන්ධවන තවත් ජල ධාරාවකි. එය වේරස් ගඟ ය. වගුරු බිම අතරින් දිව යන පාරවල් කිපයක් ද වේ. දෙහිවල–මහරගම, වැල්වත්ත, පිටවැල්ල සහ අත්තිඩිය පැපිලියාන මාර්ගයි. කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව සහ දෙහිවල ගල්කිස්ස පාලන ප්‍රදේශවලට ඇතුළත් වී ඇත. වැඩි ප්‍රමාණයක් දෙහිවල ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශයට අයත් ය. අතික කැස්බෑවට ය. උතුරු දකුණ බොරලැස්ගමුව සහ පැපිලියාන නැගෙනහිර ප්‍රදේශයන්ට ය.

මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට කිට්ටු එකම තෙත් බිම ය. එබැවින් විශ්ව විද්‍යාලයේ පර්යේෂණවලට මෙය උපයෝගී කරගැනීමට අපට හැකි විය. ඒ අනුව මෙම තෙත් බිමෙහි අධ්‍යයන ප්‍රදේශ කිහිපයක් තෝරාගෙන එහි පසෙහි සහ ජලයෙහි ඇති තිදැල්ලේ හැසිරෙන ඒක සෛලීය සතුන් ප්‍රෝටොසෝවාවන් තෝරාගෙන විද්‍යාගාර රෝපණ කිරීමක් සිදු කෙරිණ. මෙවැන්නක් ශ්‍රී ලංකාවේ කළ ප්‍රථම අවස්ථාව ලෙස සැලකිය හැක. මගේ අධීක්ෂණය යටතේ මෙය කරන ලද්දේ දීපානි සෙනවිරත්න මෙනවිය විසිනි. මෙහිදී සිදුකරණ ලද තෙත්බිම් පර්යේෂණ මාලාවට එහි ඇති ජලය බැස යන මාර්ගද, සත්ත්ව හා ශාක වර්ග ද උපයෝගී කර ගැනිණි.

ප්‍රථමයෙන් උපයෝගී කරගැනීමට හැකි වූයේ තෙත්බිම් පෙදෙස ආශ්‍රිතව ඇති ජලය බැස යෑමේ පද්ධතියයි. වැඩි ප්‍රමාණයකින් ජලය බැස යාමේ ක්‍රියාවලියට උපකාර වූයේ බොලේගොඩ ඇල ය. බොලේගොඩ ඇල ඉහතදී එකතු වූයේ දෙහිවල ඇලටයි. එය ලන්දේසි සමයේ කරන ලද්දේ ප්‍රතිබිම්බාරාම අසල ඇති පාලම ළඟින් ය. එම නිසා දෙහිවල ඇලින් හා ඇලට වතුර බැසයාම සිදුවිය. මේ පෙදෙසේ ඇල කණ්ඩිය අසල මිනිසුන් පදිංචි වීමට පටන් ගත්මුත් එය ජපන් ආධාර අනුව වෙනස් කෙරින. බොලේගොඩ ඇලට එකතුවන දියධාරා පෙදෙස් කීපයකින් ගලයි. ඇල මීටර් 15 පමණ දිගින් යුක්ත වේ. මේ ඇලට එකතුවන කුඩා ඇල පාරවල් කීපයකි. ඇල නිතර ගහනය වී ඇත්තේ ජපන් ජබර (Eichornia Crassipeds) නම් ජලජ පැළෑටිවලිනි. මෙම ඇලෙහි ඇති තියරවල් නිසා පිට ජලය ඇතුල්වීම සිදු නොවේ. නිසි අයුරු ඇතුළත්වන කුඩා කානු නිසා ගලා එන ජලය මිස අපවිත්‍ර ජලය ඇතුල්වීම සීමා වේ. තවත් දෙයක් නම් කුණු දැම්ම සහ කාර්මික අපද්‍රව්‍ය නිසා යම් ප්‍රමාණයකින් ජලය අපවිත්‍ර වේ. බොලේගොඩ ඇලට ඇතුල්වීම වන්නේ තෙල් ඇල යන කුඩා කාණුවෙනි. තෙල් ඇල මීටර් 3 ක් පමණ දුර රත්මලානේ කාර්මික ප්‍රදේශයෙන් ගලා එයි. තවද එහි වතුර ආදිය මේ තෙල් ඇල දිගේ ගලා බසී. මෙම කාර්මික අපද්‍රව්‍ය සහ දෙහිවල ගල්කිස්ස නගර සභාවේ කුණු දැම්මේ වැඩ නිසා අපවිත්‍රතාව තවත් වැඩි කෙරේ. තෙල් ඇල බොලේගොඩ ඇලට එකතුවන මේ අයුරු ස්ථාන 3 කින් පමණ පෙන්වාදිය හැක. බොලේගොඩ ඇලට බැසයන තවත් කුඩා ඇලකි කටු ඇල. මෙයට සම්බන්ධ වන ජලය උතුරු නැගෙනහිර පෙදෙස් වලිනුත් නුගේගොඩ නගර පෙදෙසිනුත් ගලා එයි. පෙදෙසට සම්බන්ධවන තැන ලවන මිශ්‍ර ජලය වෙන්කිරීමට තනන ලද ගේට්ටු කීපයකින් සමන්විත ස්ථානයකින් ගලා බසියි. මෙහි ජලධාරිතාව සීමා කරයි. බොලේගොඩ ඇලට බැසයන ජලයේ සීමාවක් කරයි. මෙහිදිත් අපට දක්නට ලැබෙන ජලජ පැළෑටිය නම් ජපන් ජබර ය. ජලය පොම්ප කිරීමේ කුටියත් තනා ඇත. වී වගාවට මිශ්‍රවන ලවන ජලය සීමා කරයි. එය අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස පෙනේ. ජලය

**මෙය ස්වාභාවිකව අප ලබා ඇති ඉතා මහඟු දායාදයකි. බෙල්ලන්විල – අත්තිඩිය වගුරුබිම වශයෙන් නම් කර ඇති කොළඹට නුදුරු දකුණු කොළඹ පිහිටි එකම තෙත් බිම මෙයයි.**



මිශ්‍රවීම අප පර්යේෂණ ව්‍යාපෘතියට ද බලපෑ අයුරු පෙන්නුම් කරයි. ජලය රැඳවුම් සිදුවන තෙත් බිම් ලෙස අප දක්වන ප්‍රදේශවල ශාක වර්ගවල විශේෂතාවක් නොමැති වුවත් එම නිසා මෙහි ඇති ජීවීන්ටත් පසටත් බලපාන අයුරු පෙන්වයි. මෙහි ඇති පැලෑටි වර්ග වලින් පෙන්වා දිය හැකි කරුණු කීපයකි. එකක් ජලයෙන් යටවී යන පවතින තණබිම ය. අනික තෙත් බිම් ආශ්‍රිත කුඩා වනරොදවල් ය. තවත් දෙයක් ලෙස දැක්විය හැකි විවෘත ජලයෙහි ඇති ශාක වර්ගයන් ය. ජලජ ශාක විවෘත ජලයෙහි ඇති ශාක වලින් ප්‍රමුඛ තැනක් ගන්නේ ජපන් ජබරයි. තවත් දෙයක් නම් සැල්විනියා හා ජබර ය. ජලයෙහි ඇති ශාක වශයෙන් ඕලු වර්ග ද මානෙල් වර්ග ද , නිල්මානෙල්, රතු මානෙල්, කුරු මානෙල් සහ කුමුදු ද වේ. තියරවල නිතර දැකිය හැකි වන්නේ වෙල් ආතා ය. (Anona galabra) අනික බෙරුදිය තිල්ල ය. වෙල්ආතා මෙන් තැනින් තැන ගොන් කදුරු දැකිය හැක. සමහර තැන්වල වැටකෙයියා ශාක ද අයත් වේ. එකතු වී ඇති වැල් වර්ග අතුරින් වතුපාලු සහ පඹ විශේෂ තැනක් ගනී. මෙම තෙත් බිමෙහි උතුරු පෙදෙස්වල අගමුල නැති වැල් ද වැවී ඇත. දිය පහරවල් සම්බන්ධවූ බොලේගොඩ ඇල කටු ඇල සහ පොඩි ඇල සමග ඇති ශාක වශයෙන් ජපන් ජබර, බෙරුදිය තිල්ල, ජබර ගිරාපලා හා දිය පාසි වේ. තැන් තැන්වල තණබිම් ද වේ. ඒවා අතර දියතලකොල බෙරුදිය තිල්ල සහ වතුරවල ප්‍රමාණය අනුව ලූනුවිල කිඹුල්වැන්න දියකුඩලු කෙතල සහ කන්කුන් දැකිය හැකි ය. කලින් දක්වන ලද ඕලු, මානෙල්, කෙකටිය වතුරවල ප්‍රමාණය අඩු තැන් වල සීමා වේ. මේ අතර වෙල්ආතා කොන්කදුරු උස් ශාකවශයෙන් පෙනේ. වැසි ජලයෙන් යටවෙන පෙදෙස තණබිම් ලෙස පෙන්නුම් කළත්, මෙහි පත්වර්ග තණවර්ග පෙනේ. උස් ගස් වශයෙන් තැන් තැන්වල දිය මිදැල්ල ගස් දැකිය හැක. තෙත් බිම් පරිසරය තුළ ඇති ශාක ප්‍රජාවේ මිශ්‍රණයක් ය. මෙම උස් ගස් පරිසරයට සීමාවූ ශාක වශයෙන් වල් ආතා, වැට කෙයියා, දන් ගස්, සහ මහමිදි විශේෂ තැනක් ගනී. වැල්වර්ග වශයෙන් ගස් ආශ්‍රිත දැකිය හැක්කේ පඹ බලයි පහුරු, අගමුල නැති වැල් ය. කඩොලාන පරිසරයක් නොව වෙනස් වගුරු තෙත් බිම් පරිසරයක් මෙහි දැකිය හැක. මෙම තැන්වල ශාක වර්ග සඳහා මිනිසුන් ඇදීයාම අඩු ය. එහෙත් වැටකෙයියා කොල සහ වෙල් ආතා ලී ඉනි එක් එක් වැඩ සඳහා ඔවුන් විසින් යොද ගනී.

සතුන් වර්ග ගැන සඳහන් කරන විට මෙහි කුරුළු විශේෂ ප්‍රමුඛ තැනක් ගනී. මේ ගැන ආයතන රාශියක් දත්ත එකතුකර ඇත. පළමුව, ලංකා ගුරු සංගමය එකතුකරගත් දත්ත මත අනිකුත් ආයතන ද කරුණු සකස් කර ඇත. කුරුළු විශේෂ හා කුරුළු වර්ග ගැන එකතු කරන ලද දත්ත අනුව වැඩිම ගණන වශයෙන් විශේෂ 152 ක් පමණ දක්වා ඇත. ක්‍රමයෙන් සිදුවූ වැඩිවීම වගුරු ස්ථාන වැඩිවීම අනුවත් මේ ගැන උනන්දු වන පිරිස් වැඩිවීමත් ය. බස්නාහිර පළාතේ කුරුළු වර්ග ලැගුම් ගන්නා තැන් වලින් පොහොසත් තැනක් ලෙස බෙල්ලන්විල වගුරු බිම යොද ගැනීම අපට දැකිය හැකි සුලභ දෙයකි. ජලය ආශ්‍රිතව ජීවත්වන සැරිසරන කුරුලු පාරාදීසයක් බවට පත්වීම ඉතා වැදගත් ය.

කුරුලු සම්පතට එක් විය යුතු කුරුලු වර්ග අතර ඉන්දියානු පුංචි දියකාවා නිල් පාට පපු පෙදෙස ඇති කාවා සහ පුංචි කොරවක්කා ද වේ. අලුපත් දඩුවා තවත් කුරුල්ලෙකි. කොකුන් වර්ග කීපයකි. මහසුදු කොකා, කහමැටි කොකා, අළු කොකා සහ කරවැල් කොකා ඊට අයිති ය. සුදු දන තුඩුවා, විවිරතුඩුවා සහ හැඳිආලවා ද මෙහි වෙසෙති. විශේෂ තැනක් ගන්නේ කිතලා, නිල්කිතලා, සවුල් පෙඳදිය සඳහා ගැලිහුවා සහ ලතුවැකියා ය. පෙදෙස තරණය කරන කුරුල්ලන් වසර තුළදී කලින් කලට වෙනස් වේ. වසරක් පාසාම වගුරු බිම් සොයා එන කුරුල්ලන් ද වේ. ආහාර, ජල අවශ්‍යතාව හා ප්‍රජනක අවස්ථා සඳහා ද එය සිදු වේ. මෙහි තවත් දක්නට ලැබෙන්නකි. සංක්‍රමණය වන කුරුලු විශේෂ.

භාරතයේ මෙවැනි තෙත්බිම් කුරුලු පාරාදීසයන් ලෙස සුරක්ෂිතව තබා ගන්නා අයුරු අපට දැක ගත හැකි විය. මා දුටු ඉන් එක් ස්ථානයකි, උත්තර ප්‍රදේශයෙන් පාවබ්ගන්ජ් කුරුලු අභය භූමිය (Pwabganj bird sanctuary) මේ කුරුලු අභය භූමියේ නො කළ යුතු කරුණු 3 ක් සඳහන් කර ඇත. ඒවා නම් ගිනි දැල්වීම හා ආහාර පිසීම, ට්‍රාන්සිස්ටර් රෙකෝඩ් ප්ලේයර් හා සංගිත වාදනය, කුරුල්ලන්ට හිංසා කිරීම හා මැරීම යි.

අප අභය භූමි විනාශ වෙමින් පවතින්නේ නීතිගරුක පිරිස් නැති නිසා ය. බෙල්ලන්විල වගුරුබිමෙහි දේශීය හා සංචාරක කුරුල්ලන් ද දැකිය හැක. අපට රටෙහි දකුණේ සිට උතුරු පෙදෙසට ගමන් කරන, මෙම වගුරු බිම නැවතුම් පළක් ලෙස සලකන කුරුල්ලන් ද වේ.

මෙහිදී අප කිව යුතු වැදගත් දෙයක් නම් මෙම තෙත් බිමෙහි ලොකු ගස් කැපීම නිසා කුරුලු ප්‍රමාණය ද අඩුවෙමින් පවතින බව ය.

අනිකුත් සතුන් ගැන සැලකීමේ දී, ලැබී ඇති දත්ත අනුව මසුන් විශේෂ 43 ක් පමණ වේ. මෙම දිය පාරවලට සීමා වූ මසුන් වර්ග ද වේ. මේ මසුන් වර්ග අතර අප රටට ගෙනවුත් බෝ කරන ලද තිලාපියා නොහොත් ජපන් කොරලි වැඩි වශයෙන් දක්නට ඇත. ඒ හැර ඉපිලිකඩයා සහ පරැඩැල් කනයා ද වේ. ජල පොම්පාගාරය අසල ගලා බසින දිය දහරෙහි විසිදැල් පාවිච්චිකර කුඩා මසුන් අල්ලා ගන්නා අයුරු එද අප දැක ඇත. එය දැන් අඩුවී ගොස් ඇති බව පෙනේ.

මෙම තෙත් බිම් පරිසරයෙහි ජලය ඇති තැන්වල අන්කුට්ටා, පත් අන්කුට්ටා, මඩ අඟුලුවා, වෙල් අඟුලුවා ජීවත් වේ. කුඩා මසුන් ලෙස පෙතියන්, උඩ්ඩන්, ගපි සහ තිත්තයන් ද වේ. මගුරන් වර්ග කීපයක් ද වේ.

අනිකුත් සත්ත්ව වර්ග ගැන සඳහන් කරන විට විශේෂ 30 ක් පමණ උරගයන් ද ඇත. උරගයින් අතුරෙන් නයි වර්ග වන්නේ දෙපත්නයා, ඉරිකරවලා, නයා, පොළඟා සහ ගැරඩියා ය. තව ද දිය පොළඟා, පුල්ලි දත්කැටියා සහ පිඹුරා ද වේ. කිඹුලන් ලෙස වාසය කරන සතෙකි හැල කිඹුලා. දිය පහරවල්වලින් ගොඩට ඇදී එන විශාල කිඹුලන් ද විටින් විට දැක ගත හැක. ඉබ්බන් වර්ග වන කිරි ඉබ්බන් සහ ගල් ඉබ්බන් ද ජීවත් වේ. කටුසු වර්ග හා හිකනැල් වර්ග කීපයක් ද දැකිය හැක. තලගොයා සහ කබරගොයා සුලබ දර්ශනයකි. ක්ෂීරපායි සතුන් ද 13 ක් පමණ දැක ඇත. මීයන් වවුලන්ට අමතරව උගුඩුවා, අඳුන් දිවියා, කොළදිවියා සහ හෝතඹුවා නිතර මෙම පෙදෙස්වල දැක ගත හැක. බෙල්ලන්විල අත්තිඩිය තෙත් බිමෙහි ඇති කුරුලු වර්ගවලට අමතරව සමනල වර්ග රාශියක් වේ. එද අපට දක්නට ලැබුණු සමනල වර්ග රැසක් පරිසරය අපවිත්‍ර වීම හා පරිසරයට කරන ලද හානි නිසා අද අඩුව ඇතත් මෙය සමනල රජ දහනක් ලෙස ද සැලකිය හැකි ය.

අප විසින් කරන ලද පර්යේෂණවලින් පසෙහිත් ජලයෙහිත් වගුරු බිමෙහිත් තැන්

> **“ මේ ස්වභාවික දායාදය කෙලෙසීමට එය තුළට ගෙනවුත් දමන කුණු කසළ විශාල තර්ජනයකි. මහනගර සභාවට හිමි එකම පරිසර දායාදය, කුණු කසළ දමා විනාශ කිරීම පුදුම උපදවන්නකි. මෙම නගර සභාවේ කුණු කසළ ඉවත් කිරීම සඳහා ජපන් රටින් පරිත්‍යාග කරන ලද දේ අපමණ ය. මෙලෙස වරක් මෙම තෙත් බිම තුළ සිදුවන මිනිස් අපරාධ මැඩලීමට ජපන් රට මැදිහත්වී 1992 දී මෙහි පදිංචි වී සිටි පිරිස්වල වෙනසක් සිදු කළ බව ද වාර්තා වී ඇත. ”**

කීපයකින් එකතු කරන ලද ප්‍රොටොසෝවාවන් එනම්, ඒක සෛලීය සතුන් රාශියකි. මෙම සතුන් මේ ප්‍රජාවට සම්බන්ධ ශාක අතර ද අතිකුන් කුඩා ජීවීන් අතර ද දැක බලා ගත හැක. එසේ වෙන් කරන ලද ඒක සෛලීය සතුන් විශ්ව විද්‍යාලයේ විද්‍යාගාරය තුළ රෝපණය කර දත්ත රැසක් එකතුකරගත ඇත. මේ අතුරෙන් ප්‍රෝටොසෝවා විශේෂ 29 ක් පමණ සොයාගැනීමට හැකි විය. මෙහි ඇති ජලය සතුන ගේ ව්‍යාප්තිය සහ පැතිරීම කෙරෙහි බලපායි. මෙම විශේෂ 29 න් 8 ක් ම ඇමිබා වර්ගයි. 14 ක් පක්ෂ්මධරයන් ය. කෂිකාධර සතුන් විශේෂ 7 ක් වේ. මෙම තිදැල්ලේ හැසිරෙන සතුන් මෙන් ම සතුන්ගේ කෝෂ්ඨ ද එකතු කරගත හැකි විය. උෂ්ණත්වය, දියසීරාව සහ දේශගුණික වෙනස්වීම් ද අධ්‍යයනයට ඇතුළත් විය. ප්‍රෝටොසෝවාවන්ට අමතරව රොටිපෙරාවන් ද ප්ලැනේරියා පණුවන් ද සොයා රෝපණය කරගත හැකි විය. මෙම අධ්‍යයනයට සම්බන්ධ ශාක වර්ග හා ඒවායේ බලපෑම් ද නිගමනය කර ගත හැකි විය.

බෙල්ලන්විල – අත්තිඩිය වගුරුබිම අද විනාශ මුඛයට ඇදී යයි. මෙය, කොළඹට නුදුරු දෙහිවල ගල්කිස්ස මහනගර සභාවට වැඩිපුර හිමිකම් කිව හැකි තැනකි. මේ වගුරු බිම වැනි අප රටෙහි ඇති තෙත් බිම් නිසා අපට ලැබී ඇති දයාද රැසකි. මේ ස්වභාවික දයාදය කෙලෙසීමට එය තුළට ගෙනවුත් දමන කුණු කසළ විශාල තර්ජනයකි. මහනගර සභාවට හිමි එකම පරිසර දයාදය, කුණු කසළ දමා විනාශ කිරීම පුදුම උපදවන්නකි. මෙම නගර සභාවේ කුණු කසළ ඉවත් කිරීම සඳහා ජපන් රටින් පරිත්‍යාග කරන ලද දේ අපමණ ය. මෙලෙස වරක් මෙම තෙත් බිම තුළ සිදුවන මිනිස් අපරාධ මැඩලීමට ජපන් රට මැදිහත්වී 1992 දී මෙහි පදිංචි වී සිටි පිරිස්වල වෙනසක් සිදු කළ බව ද වාර්තා වී ඇත.

මෙම කුණු දැමීම සඳහා විකල්පයක් නැද්ද? ලෝකයේ අතිකුන් රටවල් ගැන දන්නා පමණින් කුණු දැමීම සහ ඒවා නියම අයුරු ඉවත් කිරීමට සැලසුම් ක්‍රියාත්මක වේ. අපේ අසල්වැසි ඉන්දියාවේ බැංගලෝර් නගරය, දිල්ලිය එයට නිදසුන් ය. මෙවැනි පරිසරය කෙලෙසීමට දිරි වඩන දෙහිවල ගල්කිස්ස නගරයේ, සැලසුම් සහගත ක්‍රියාවකට කුණු ඉවත් කිරීම කළ නොහැකි දෙයක් දැයි මා නොසිතමි. බෙල්ලන්විල – අත්තිඩිය වගුරු බිම වෙන්කර හඳුනා ගැනීම වැඩි කොටස දෙහිවල ගල්කිස්ස නගර සභාවට අයිතිය. කැස්බෑව බොරලැස්ගමුවට අයත් වන්නේ ඉතා සුළු ප්‍රමාණයකි. මෙම වගුරු බිම් පෙදෙස නිසි අයුරු මායිම් කණු යොදා වෙන් කිරීම පරිසර හිතකාමී දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවෙන් සිදු විය යුත්තකි. අවසාන වශයෙන් මිනිසා සහ ජෛවගෝලය වැඩ සටහනින් හෝ පරිසර හිතකාමී වැඩසටහන්වල සහාය ඇතිව දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ විශේෂ වැඩ සටහනකින් හෝ කණු සිටුවා වෙන්කර ගන්නේ නම් දැන් ජීවත් වන පරපුරට නොව අනාගත පරපුරටත් විශාල සෙතකි. මෙම වගුරු බිමෙහි ඉතිරිව ඇති ශාක සතුන් සහ ජලජ පරිසරය රැක ගැනීම අප සතු යුතුකමකි. තව ද මෙම පරිසර ප්‍රදේශය අවට ඇති පාසල්වල උදව් උපකාර ලබාගෙන සිසුන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් ද යොදා මෙම බෙල්ලන්විල – අත්තිඩිය තෙත් බිම් පරිසරය සුරැකීම අප සතු විශාල වගකීමකි.. ❏